ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශය

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, කොලොන්නාව

ටෙන්ඩර් දැන්වීම

භාවිතයෙන් ඉවත් කරන ලද වාහන විකිණීම.

ටෙන්ඩර් අංකය :- 26/TN/001

01.කොලොන්නාව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තු ටෙන්ඩර් කමිටුවේ සභාපති විසින් පහත සඳහන් භාවිතයෙන් ඉවත් කරන ලද වාහන විකිණීම සඳහා **2026.11.10** දින පෙ.ව.10.30 දක්වා මිල ගණන් කැඳවනු ලැබේ.

අනු අංකය	වාහන අංකය	වර්ගය	මාදිලිය	නිෂ්පාදිත වර්ෂය	ආපසු නොගෙවන තැන්පත් මුදල (රු.)	ලංසු ඇප තැන්පත් මුදල (රු.)	කාර්යසාධන බැඳුම්කරය (රු.)
01	64-3689	Mitsubishi	මෝටර් කාර් රථය	1993	2,500.00	5,000.00	50,000.00
02	LC – 5833	TATA	මෝටර් ලොරි රථය	2006	2,500.00	5,000.00	50,000.00

02. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසු කරුවන්හට කොලොන්නාවේ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ සරප් වෙත ආපසු නොගෙවනු ලබන රු.2,500.00 ක ගාස්තුව ගෙවා ලබාගත්නා ලද කුවිතාන්සියේ මුල් පිටපත සමඟ, ලංසු මිල ගණන් කැඳවනු ලබන ආකෘති පත්‍ර ඉල්ලන ලද ලිපියක් ප්‍රධාන ගණකාධිකාරී වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ලංසු ලියවිලි ලබාගත හැකිය.

03. එසේම, ඉහත 01 ඡේදයෙහි ඇති වගුවේ සඳහන් ආපසු ගෙවනු ලබන ලංසු ඇප සුරකුම් තැන්පත් මුදල රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවීමෙන් පසු ලබාගන්නා කුවිතාන්සිය මිල ගණන් සමඟ ඉදිරිපත් කල යුතුය.

04. එමෙන්ම,මේ සඳහා උනන්දුවක් දක්වන ලංසු කරුවන්හට **2026.10.27** දින සිට **2026.11.09** දින **ප.ව. 3.00** දක්වා රජයේ වැඩ කරන දිනවල කාර්යාලීය වේලාවන් තුලදී (පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා) ප්‍රධාන ගබඩා භාරකරු හමුවීමෙන් මෙම වාහනය පරීක්ෂා කර බැලිය හැකිය. වාහනය පරීක්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තු පරිශ්‍රය තුලට යාමට පෙර ගිණුම් අංශයේ පිරිවැය ඒකකයෙන් ලබා ගන්නා වැඩහල් දොරටු අවසර පත්‍රය (Gate Pass) ආරක්ෂක අංශය වෙත ඉදිරිපත් කල යුතු වේ.

තවද, මේ පිළිබඳ වැඩිදුර විස්තර දුරකථන අංක 0112-572351 අමතා දුරකථන දිගුව ප්‍රධාන ගණකාධිකාරී 121, ගණකාධිකාරී (ගෙවීම්/ ගබඩා) 123 හෝ 125 හෝ වෙතින් ලබාගත හැක.

05. එක් එක් වාහන සඳහා වෙන වෙනම ලංසු ඉදිරිපත් කළ යුතු අතර එක් වාහනයක් සඳහා ඉදිරිපත් කරනු ලබන ලංසුව පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. එහිදී ලංසු ලියවිලි මුල් පිටපත බහාලූ කවරය මුද්‍රා තබා කවරයේ මුල් පිටපත යනුවෙන් ද අනු පිටපත බහාලූ කවරය මුද්‍රා තබා පිට පැත්තේ අනු පිටපත යනුවෙන් ද සඳහන් කර එම කවර දෙකම එකම කවරයක බහා මුද්‍රා තබා ටෙන්ඩර් අංකය හා ලංසු ඉදිරිපත් කරන වාහන අංකය සඳහන් කර **" සභාපති, දෙපාර්තමේන්තු ටෙන්ඩර් කමිටුව, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, කොලොන්නාව "** යන ලිපිනයට 2026.10.27 දින සිට 2026. 11.09 දින දක්වා රජයේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ද 2026.11.10 දින පෙ.ව. 9.00 සිට පෙ.ව. 10.30 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ තුන්වන (3) මහලේ පිහිටා ඇති අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ තබා ඇති, මෙම ටෙන්ඩරයට අදාළ පෙට්ටියට බහාලීමට කටයුතු කල යුතු වේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති,
දෙපාර්තමේන්තු ටෙන්ඩර් කමිටුව,
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව,
කොලොන්නාව.
2026.10. 27